**1.** **ශීර්ෂය 2 - අග්‍රාමාත්‍ය කාර්යාලය**
-----------------------------------

**1.1** **විගණන විෂය පථය**
----------------------

අග්‍රාමාත්‍ය කාර්යාලයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන,පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 සැප්තැම්බර් 18 දින අග්‍රාමාත්‍ය ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් හා සොයා ගැනීම් , විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය හා ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය හා ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2** **ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම**
---------------------------------------------------------------------------------------------

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම , ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2.3** **විගණන නිරීක්ෂණය**
----------------------

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා සහ පොත් අනුව අග්‍රාමාත්‍ය කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශනය මෙහි (අ) හා (ආ) හි දක්වා ඇති පොදු නිරීක්ෂණ සහ පහත 2.4 සිට 2.6 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ)** **අයවැය විචලනය**
-------------------

වැය විෂයයන් 08 ක් සඳහා එකතුව රු. 19,600,000 ක අධිප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු රු.12,502,997 ක ප්‍රතිපාදන ඉතිරි වි

තිබුණි. එම ඉතිරිය වැය විෂයයන් සඳහා සළසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 35 සිට සියයට 100 දක්වා වූ පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**(ආ) රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 00201 දරන අත්තිකාරම් ගිණුම පිළිබඳව 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිටි තිබුණ ශේෂවල එකතුව රු. 38,836 ක් වූ අතර, එම හිඟහිටි ශේෂය අයකර ගැනීමට කාර්යාලය අපොහොසත් වී තිබුණි.

## 2.4 වත්කම් කළමනාකරණය

**බේරුම් නොකළ බැරකම්**

2013 අගෝස්තු, සැප්තැම්බර්, නොවැම්බර් හා දෙසැම්බර් යන මාසවලට අදාළව 2014 වර්ෂය තුළ නිරවුල් කර තිබූ එකතුව රු.3,072,070 ක් වූ බැරකම්, විසර්ජන ගිණුමේ බැරකම් පිළිබඳ ප්‍රකාශයේ දක්වා නොතිබුණි.

## 2.5 පාඩු හා හානි

"විසුම්පාය" නිල නිවසේ හා අග්‍රාමාත්‍ය කාර්යාලයේ විදුලි බිල්පත් නියමිත දිනට පෙර නොගෙවීම නිසා සමාලෝචිත වර්ෂයට අදාලව පිළිවෙලින් රු.25,921 ක් හා රු.107,074 ක් වශයෙන් එකතුව රු.132,995 ක් දඩ මුදල් ලෙස ගෙවා තිබුණි.

## 2.6 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2013 දෙසැම්බර් 31 දිනට සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 14 | 12 | 02 |
| (ii) | තෘතියික මට්ටම | 05 | 04 | 01 |
| (iii) | ද්විතීයික මට්ටම | 45 | 41 | 04 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 67 | 66 | 01 |
| | **එකතුව** | **131** | **123** | **08** |

සමාලෝචිත වර්ෂය අවසාන දිනය වන විට පුරප්පාඩු 08 ක් පිරවීමට කාර්යාලය කටයුතු කර නොතිබුණි.